JULY 1, 2022

# 19 සංශෝධනය 22 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත සහ ප්‍රතිසංස්කරණ සඳහා සාමූහිකයේ යෝජනා පිලිබද සංසන්දනාත්මක විවරණයක්


**ප්‍රතිසංස්කරණ සඳහා සාමූහිකය**

HP

[Company address]

# 19 සංශෝධනය 22 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත සහ ප්‍රතිසංස්කරණ සඳහා සාමූහිකයේ යෝජනා පිලිබද සංසන්දනාත්මක විවරණයක්

## • හැදින්වීම

19 වන ව්‍යවස්ථා සංශෝධනය දක්වා සංශෝධනය වූ වර්ථමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා කෙටුම්පත් දෙකක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් විය. එක් කෙටුම්පතක් 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ලෙස සමගි ජන බලවේගය පක්‍ෂයේ (විපක්ෂයේ ) පාර්ලිමේන්තු මන්ත්‍රි රංජිත් මද්දුම බණ්ඩාර විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර. එම කෙටුම්පතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකුල භාවය පිලිබදව සිය තීරණය කථානායක වෙත ඉදිරිපත් වූ අතර එය කථානයක විසින් 2022 ජූනි 21 වන දින සභාගත කරන ලදී (SC SD No 31/2022). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා වූ අනෙක් කෙටුම්ත 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද්දේ ආණ්ඩුපක්‍ෂයේ එවකට මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කල පසුව අධිකරණ අමාත්‍යධූරය භාරගත් ආචාර්ය විජේදාස රාජපක්‍ෂ විසිනි. එම කෙටුම්පත ඉල්ලා අස්කරගන්නා බවට එම කෙටුම්පත පිලිබද ශ්‍රේෂ්ඨාධිකරණ විභාගයේදී නීතිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත දන්වා තිබිණි.[1]

පසුව විජේදාස රාජපක්‍ෂ අධිකරණ අමාතනවරයා විසින් 2022 මැයි 23 වන දින 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නමින් කෙටුම්පතක් L.D.O. 12/22 අංකය යටතේ කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර එය සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත අදහස් දැක්වීම සඳහා ඉදිරිපත් කරන ලදී.

ඉන් පසුව 2022 ජූනි 20 වන දින 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත නමින් හදුන්වන කෙටුම්පතක් (මැයි 23 වන දින කෙටුම්පතට මදක් වෙනස් වූ ) අධිකරණ අමාත්‍යවරයා විසින් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතර එයට 2022 ජූනි 26 වන කැබිනට් මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැති ලැබූ අතර ඒ අනුව එය ගැසට් පත්‍රයේ පලකිරීමටත් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබිණි.[2] ඒ අනුව එම කෙටුම්පත 2022 ජූනි 29 වන දින ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් ලෙස පලකරන ලදී.[3]

පවතින දේශපාලන සහ ආර්ථික අර්බුධයට එක් විසදුමක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සඳහා වූ විවිධ යෝජනා විවිධ සංවිධාන සහ දේශපාලන පක්‍ෂ විසින් ඉදිරිපත් කරන ලද අතර ඒකී යෝජනා 28ක් සැලකිල්ලට ගෙන (සැලකිල්ලට ගත් යෝජනා ලැයිස්තුව සඳහා ඇමුණුම් -I

[1] https://sinhala.lankanewsweb.net/05/26/18196/ 30-06-2022

[2] http://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=16&Itemid=49&lang=si&dID=11637 29-06-2022

[3] http://www.documents.gov.lk/files/bill/2022/6/217-2022_S.pdf 30-06-2022

බලන්න)සිවිල් සංවිධාන රැසකින් සමන්විත එකමුතුවක් වූ ප්‍රතිපසංස්කරණ සඳහා වූ සාමූහිකය (ප්‍රතිසංස්කරණය සඳහා වූ සාමූහිකයේ සාමාජික ලැයිස්තුව ඇමුණුම් - II ) විසින් යෝජනා 11කින් යුතු යෝජනාවලියක් සියලුව දේශපාලන පක්ෂ වෙත 2022 ජූනි 22 වන දින ඉදිරිපත් කරන ලදී.

මෙම සියලුම යෝජනාවල පොදු අදහස වූයේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ප්‍රතිපාදන යලි ස්ථාපනය කිරීම සහ/හෝ 19වන සංශෝධනයෙන් ඉදිරියට ගිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකි. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ බොහෝ නීතිමය ප්‍රතිපාදන 20 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් අහෝසි කරන ලද අතර

- තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ අයිතිය,
- අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව පිලිබඳ සීමාවන්,
- පාර්ලිමේන්තුවේ කාල සීමාව අඩු කිරීම,
- ජනාධිපතිධූරයේ කාලසීමාව අඩු කිරීම,
- ජනාධිපතිට අපේක්ෂකයකු ලෙස තරග කල හැකි වාර ගනන පිලිබඳ සීමාවන්,
- විගනකාධිපතිගේ බලතල, යන ප්‍රතිපාදන 20 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධනය නොකරන ලදී.

ඒ අනුව 19 වන සංශෝධනය මගින් ස්ථාපිත කරන ලද සහ 20 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධනයට ලක් කරන ලද ප්‍රතිපාදන, 22 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ ( අධිකරණ අමාත්‍යවරයා විසින් 2022 ජූනි 29 දින ගැසට් පත්‍රයේ එලකරන ලද) ප්‍රතිපාදන සහ ප්‍රතිසංස්කරණය සඳහා වූ සාමූහිකය විසින් ඉදිරිපත් කරන අද සංශෝධන යෝජනා පිලිබඳව සංසන්දනාත්මක විවරණයක් මෙම වාර්ථාව මගින් සිදුකරනු ලැබේ.

එම සංසන්දනය එක් එක් ශිර්ෂයන් යටතේ සිදුකරනු ලැබේ.

- **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව**

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව යලිත් හඳුන්වාදීම සිදුකල අතර එම සභාවේ සංයුතිය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 7 දෙනෙකුගෙන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් නොවන සාමාජිකයන් 3 දෙනෙකුගෙන් සමන්විත විය. 22 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත මගින් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වාදුන් සංයුතියට සැම අතින්ම සමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් ස්ථාපනය කිරීමට යෝජනා කරනු ලබයි.

නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත පත්කල යුතු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන තිදෙනා පත් කිරීම සම්බන්ධ නාමයෝජනා බලය 19 වන සංශෝධනය යටතේ අගමැතිට සහ විපක්ෂ නායකට හිමිවූ අතර 22 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් යෝජනා කරනු ලබන්නේ මෙම සාමාජිකයන් තිදෙනා පත් කිරීම පාර්ලිමේන්තුවේ බහුතර එකගතාව මත කථාකායකවරයා විසින් නාමයෝජනා කල යුතු බවයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සාමාජිකයන් 10 දෙනා අතරින් 5 දෙනෙකු වෘත්තියවෙදින්/සිවිල් සමාජ ක්‍රියාකාරිකයන් විය යුතු බවට ප්‍රතිසංස්කරණය සඳහා සාමුහිකය යෝජනා කරන අතරම ව්‍යවස්ථා සභාවේ බලතල සහ වපසරිය පුලුල් කිරීමට යෝජනා කරනු ලබයි, ඒ අනුව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සලසා තිබූ ප්‍රතිපාදන වලට අතිරේකව අමාත්‍යංශ ලේකම්වරුන්, ආණ්ඩුකාරවරුන්,තානාපතිවරුන් සහ දූත මණ්ඩල ප්‍රධානීන්, මුදල් මණ්ඩලය, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වරාය නගර කොමිෂන් සභාවේ නිලධාරී මණ්ඩලය,විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යන ආයතන සඳහා කොමසාරිස්වරුන් පත්කිරීම සඳහා නිර්දේශ කිරීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ලබාදීමට යෝජනා කර ඇත.

22 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් 19 වන ව්‍යවස්ථා සංශෝධනයේ ප්‍රතිපාදනයන්ට අමතර කරුණක් ලෙස මහ බැංකුවේ අධිපතිවරයා පත් කිරීමේදී ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ලබාගත යුතු බව සඳහන් වේ.

- **ජනාධිපතිට අමාත්‍යංශ දැරීමට ඇති අයිතිය**

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිට අමාත්‍ය ධූර දැරීමට ඇති අයිතිය අහෝසි කරන ලදී (මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා ආරක්ෂක සහ පරිසර අමාත්‍යංශ දරන ලද්දේ අන්තර්කාලීන විධිවිධාන මතය) 22 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත මගින් ජනාධිපතිවෙත ආරක්ෂක අමාත්‍යංශය දැරීමට අවස්ථාව සලසා ඇති අතර වෙනත් අමාත්‍යවරුන්ට විෂයන් පවරා නොමැති අවස්ථාවක දින 14ක් දක්වා අමාත්‍යධූර දැරීමේ හැකියාව ලබාදී ඇත.

ප්‍රතිසංස්කරණ සඳහා සාමුහිකයේ යෝජනාව වන්නේ ජනාධිපතිවරයාට අමාත්‍ය ධූර දැරිය නොහැකි විය යුතු බවයි.

- **අගමැති ඉවත් කිරීමට ජනාධිපතිට ඇති බලය**

19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් අගමැතිවරයා ඉවත් කිරීමට ජනාධිපතිට ඇති බලතල ඉවත් කල අතර 22 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත මගින් නව වන පාර්ලිමේන්තුවේ අගමැතිවරයා සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ විශ්වාසය අහිමි වී ඇති බවට ජනාධිපතිවරයාගේ මතය වේ නම් එවිට අගමැති ඉවත් කිරීමේ බලය ජනාධිපතිට හිමිවිය යුතු බවට අන්තර්කාලීන විධිවිධානයක් ඇතුලත් කර ඇත.

ප්‍රතිසංස්කරණ සඳහා සාමුහිකයේ යෝජනාවන් මගින් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන්වූ ප්‍රතිපාදනම ඇතුලත් විය යුතු බවට යෝජනා කරනු ලබයි.

- **කැබිනට් මණ්ඩලය සහ කැබිනට් නොවන අමාත්‍යවරු පත් කිරීමට ජනාධිපතිට ඇති අභිමතය**

කැබිනට් මණ්ඩලය සහ අනෙකුත් අමාත්‍යවරුන් පත් කිරීමේදී ජනාධිපති අගමැතිගේ උපදෙස් මත කටයුතු කල යුතු බවට ප්‍රතිපාදන 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුල ඇතුලත් වූ අතර 22 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත මගින් යෝජනා කරන්නේ 9 වන පාර්ලිමේන්තුව විසුරුවා හරින තෙක් අමාත්‍යවරු පත්කිරීම අගමැති විමසා සිදුකිරීමටත් ඉන් පසුව අගමැතිගේ උපදෙස් මත සිදුකිරීමටත්ය.

ප්‍රතිසංස්කරණ සඳහා සාමුහිකයේ යෝජනා කරන්නනේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ප්‍රතිපාදන සලසා ඇති ආකාරයටම ජනාධිපති විසින් අගමැති විමසා එකී පත් කිරීම් සිදුකල යුතු බවයි.

- **අමාත්‍යවරුන් ඉවත් කිරීමට ජනාධිපතිට ඇති බලතල**

19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් අමාත්‍යවරුන් ඉවත් කිරීමට ජනාධිපතිට ඇති බලතල ඉවත් 22 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත මගින් යෝජනා කරන්නේ 9 වන පාර්ලිමේන්තුව විසුරුවා හරින තෙක් අමාත්‍යවරු පත්කිරීම අගමැති විමසා සිදුකිරීමටත් ඉන් පසුව අගමැතිගේ උපදෙස් මත සිදුකිරීමටත්ය.

ප්‍රතිසංස්කරණ සඳහා සාමුහිකයේ යෝජනා කරන්නනේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ප්‍රතිපාදන සලසා ඇති ආකාරයටම ජනාධිපති විසින් අගමැති විමසා එකී ඉවත් කිරීම් සිදුකල යුතු බවයි.

- **ජනාධිපතිට අතිරේක බලතල සහ වගකීම් පැවරීම**

ජනාධිපති පාර්ලිමේන්තුවට වගකිව යුතු බව සහ ජනාධිපතිට ජාතික ප්‍රතිසංධානය සහ ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීම ජනාධිපතිගේ කාර්යක් බවට 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ප්‍රතිපාදන සැලසූ අතර 20 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් එම ප්‍රතිපාදන ඉවත් කරන ලදී. 22 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත එම ප්‍රතිපාදන සංශෝධනය කිරීමට යෝජනා නොකරන බැවින් ඉදිරියටද එම ජනාධිපතිට එවැනි වගකීම් ජනාධිපතිට පැවරීමක් සිදු නොවනු ඇත.

නමුත් ප්‍රතිසංස්කරණය සඳහා වූ සාමුහිකයේ යෝජනාව වන්නේ 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ප්‍රතිපාදන සැලසා තිබූ පරිදීම ජනාධිපති පාර්ලිමේන්තුවට වගකිව යුතු බව සහ ජාතික ප්‍රතිසංන්ධානය සහ ඒකාබද්ධතාව ප්‍රවර්ධනය ජනාධිපතිගේ කාර්යයක් විය යුතු බවයි.

- **අධිකරණ සේවා කොමිෂන් සාමාජිකයන් ඉවත් කිරීමට ජනාධිපතිට ඇති බලතල**

19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් ඉවත් කිරීමට ජනාධිපතිට ඇති අභිමත බලය ඉවත් කල 20 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් එය යලිත් ජනාධිපති වෙත ප්‍රදානය කරන ලදී.

22 වන ව්‍යවස්ථා කෙටුම්පත මගින් මේ සම්බන්ධ සංශෝධනයක් යෝජනා නොකිරීම මගින් පෙනී යන්නේ ජනාධිපතිට අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් ඉවත් කිරීමට දැනට පවතින බලතල එසේම පවත්වාගෙන යා යුතු බවයි.
ප්‍රතිසංස්කරණ සඳහා සාමුහිකයේ යෝජනා කරන්නනේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ප්‍රතිපාදන සලසා ඇති ආකාරයටම ජනාධිපති වෙතින් එම අභිමත බලය කල යුතු බවයි.

- **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් ඉවත් කිරීමට ජනාධිපතිට ඇති බලතල**

19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් ඉවත් කිරීමට ජනාධිපතිට ඇති අභිමත බලය ඉවත් කල අතර 22 වන ව්‍යවස්ථා කෙටුම්පත මගින්ද එයට සමාන ප්‍රතිපාදන යෝජනා කරනු ලබයි.
ප්‍රතිසංස්කරණ සඳහා සාමුහිකයේ යෝජනා කරන්නනේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ප්‍රතිපාදන සලසා ඇති ආකාරයටම ජනාධිපති වෙතින් එම අභිමත බලය කල යුතු බවයි.

- **පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිට ඇති බලය**

පාර්ලිමේන්තුවේ මුල් රැස්වීමෙන් පසුව වසර 4 1/2 ක් ගතවන තෙක් පාර්ලිමේන්තුව විසුරුවාහැරීමට ජනාධිපතිට ඇති අභිමතය ඉවත්කර තිබිණි. එකී ප්‍රතිපාදන 20 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් වසර 2 1/2 ක් දක්වා පසුපසට ගෙන එන ලදී.
22 වන ව්‍යවස්ථා සංශෝධනය ඒ පිලිබඳව සංශෝධනයක් යෝජනා කර නොමැත.
ප්‍රතිසංස්කරණ සඳහා සාමුහිකයේ යෝජනා මගින් එම බලතල 19 වැනි සංශෝධනයේ විධිවිධාන අනුව වෙනස් කළ යුතු අතර ඒ සඳහා අග්‍රමාත්‍යවරයාගේ නිර්දේශය මත කළ යුතු බවට යෝජනා කරනු ලබයි.
මෙම ප්‍රතිපාදනවලට අමතරව ජනාධිපතිවරයා ගේ බලතල සහ කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රතිසංස්කරණ සඳහා සාමුහිකයේ යෝජනා තුල පහත කරුණු ඇතුලත් වේ

- ජනාධිපතිවරයා රජයේ ප්‍රධානියා විධායකයේ ප්‍රධානියා සන්නද්ධ සේවාවෙහි සේනාධි නායකයා විය යුතු අතර ආණ්ඩුවේ ප්‍රධානියා යන්න සංශෝධනය කොට, අගමැතිවරයාට එම බලය ලබාදිය යුතුය.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නීතියට ඉහළින් සිටින පුද්ගලයෙකු ලෙස ජනාධිපතිවරයාට ප්‍රදානය කර ඇති තත්ත්වය අහෝසි කළ යුතු ය.
- ජනාධිපති සමාව ලබාදිය යුත්තේ 19 වන සංශෝධනයේ විධිවිධානවලට අමතරව ස්වාධින කමිටුවක නිර්දේශ පරිදි ය.

- පාර්ලිමේන්තුව කල් තැබීම වාර ගණන සීමා කිරීම සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත ජනාධිපති සිදු කළ යුතු ය. එවැනි කල් තැබීමක ප්‍රතිඵලයක් ලෙස පාර්ලිමේන්තු කමිටු ක්‍රියාවලියක් හෝ විමර්ශන ක්‍රියාවලියක් අවසන් හෝ අහෝසි නොවිය යුතුයි.

## • විගනන සේවා කොමිෂන් සභාව සහ ප්‍රසම්පාදන කොමිෂන් සභාව ස්ථාපනය

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් විනගනන සේවා කොමිෂන් සභාව සහ ප්‍රසම්පාදන කොමිෂන් සභාව ස්ථාපනය කරන ලද අතර ඒ ආකාරයෙන්ම 22 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත මගින්ද එම කොමිෂන් සභා දෙක යලි ස්ථාපනය කිරීම සදහා යෝජනා කරනු ලබයි.

ප්‍රතිසංස්කරණ සදහා සාමුහිකයද යෝජනා කරන්නේ 19 ව්‍යවස්ථා සංශෝධනයේ පරිදීම විගනන සේවා කොමිෂන් සභාව සහ ප්‍රසම්පාදන කොමිෂන් සභාව යලි ස්ථාපනය කල යුතු බවයි.

## • ස්වාධින කොමිෂන් සභාවන් ගේ බලතල වැඩි කිරීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ මැතිවරණ කොමිෂන් සභාවේ බලතල වැඩි කල අතර ඒ ආකාරයෙන්ම 22 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත මගින්ද එකී කොමිෂන් සභාවල බලතල වැඩි කිරීටම යෝජනා කරනු ලබයි.
ප්‍රතිසංස්කරණ සදහා සාමුහිකයේ යෝජනා කරන්නේද 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සදහන් වූ පරිදීම ඉහතකී ස්වාධීන කොමිෂන් සභාවන්හි බලතල පුලුල් කල යුතු බවයි.

## • විදේශ පුරවැසිභාවය සහිත පුරවැසියන්ට මැතිවරණ සදහා ඉදිරිපත් වීමට අවස්ථාව අහිමි කිරීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් විදේශ පුරවැසිභාවය සහිත පුරවැසියන්ට ජනාධිපති සහ පාර්ලිමේන්තු මැතිවරණ සදහා ඉදිරිපත් වීමේ අවස්ථාව අහිමි කරන ලද අතර 22 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත් දෙක මගින්ද එය ඒ ආකාරයේම ප්‍රතිපාදන සැලසීමට යෝජනා කර තිබේ, එයට අමතරව

22 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත මගින් යෝජනා කරන විශේෂ කරුණක් වනුයේ දැනට එවැනි නුදුසුකමකට ලක්වන මන්ත්‍රීවරයකු සිටීනම් ව්‍යවස්ථා සංශෝධනය සම්මත වූ දින සිට ඔහුගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහිමි විය යුතු බවයි.

ප්‍රතිසංස්කරණ සදහා සාමුහිකයේ යෝජනා කරන්නනේද 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පරිදී ඒ පිලිබදව ප්‍රතිපාදන ඇතුලත් විය යුතු බවයි.

- **පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර පනත් කෙටුම්පතක් ගැසට් පත්‍රයේ පලකල යුතු අවම කාල සීමාව**

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර පනත් කෙටුම්පතක් අවම වශයෙන් දින 14කට පෙර ගැසට් පත්‍රයේ පලකල යුතු බවට ප්‍රතිපාදන ඇතුලත් කරන ලදී (එයට පෙර පැවතියේ දින 7ක් වන අතර පසුව 20 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් යලිත් දින 7 දක්වා අඩුකරන ලදී) 22 වන ව්‍යවස්ථා සංශෝධණ කෙටුම්පත තුල ඒ පිලිබදව සංශෝධනයක් යෝජනා නොකිරීම මගින් පෙනී යන්නේ 20 වන සංශෝධනයේ පරිදීම දින 7 කාලයක් පමණක් යෝජනා කරන බවයි.

ප්‍රතිසංස්කරණ සදහා සාමුහිකයේ යෝජනා කරන්නනේද 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පරිදී ඒ පිලිබදව ප්‍රතිපාදන ඇතුලත් විය යුතු බවයි.

- **හදිසි පනත් පිලිබද ප්‍රතිපාදන**

19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් හදිසි පනත් කෙටුම්පත් පිලිබද ප්‍රතිපාදන අහෝසි කරන ලද අතර 20 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් හදිසි පනත් කෙටුම්පත් පිලිබද ප්‍රතිපාදන යලි ස්ථාපනය කරන ලදී. 22 වන ව්‍යවස්ථා සංශෝධණයේ ඒ පිලිබදව සදහනක් නොමැති බැවින් හදිසි පනත් පිලිබද ප්‍රතිපාදන තවදුරටත් එලෙසම පවතිනු ඇත.

ප්‍රතිසංස්කරණ සදහා සාමුහිකයේ යෝජනා කරන්නනේද 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පරිදී ඒ පිලිබදව ප්‍රතිපාදන ඇතුලත් විය යුතු බවයි.

- **ප්‍රතිසංස්කරණ සදහා සාමුහිකයේ යෝජනා තුල ඇතුලත්වන 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හෝ 22 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත තුල ඇතුලත් නොවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය යෝජනා**

    1. ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් ස්ථාපිත කිරීම,
    2. පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කළ කෙටුම්පතක් කාරක සභා අවස්ථාවේ සංශෝධනයට ලක් වී සම්මත වුවහොත්, එය මාස තුනකට නොඅඩු කාලයක් තුළ දී ශේෂ්ඨාධිකරණයේ විමර්ශනය කළ හැකි බව සහතික කළ යුතු ය. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 78(3) අනු ව්‍යවස්ථාව වෙනස් නොවිය යුතුයි.
    3. නීතිපතිවරයාගේ ක්‍රියාදාමය සම්බන්ධයෙන් විනිවිදභාවයක් සහිතව වගවීම සහතික කරන යාන්ත්‍රණයක් සහ නීතිපතිවරයා සතුව පවතින ද්විත්ව කාර්යයභාරය (රජයේ නීති උපදේශක සහ අභිචෝදක) බැදියාවන් අතර ගැටුමකින් තොරව පවත්වා ගෙන යාම සඳහා සුදුසු ව්‍යුහාත්මක වෙනස්කම් ඇති කළ යුතු ය.

4. රජය විසින් නීති සම්පාදනය කිරීමේ දී සහ අන්තර්ජාතික ගිවිසුම් ඇති කර ගැනීමේ දී රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්මයන්ට ඒවායේ ඇති අනුකූලතාවය ද නීතිපති විසින් තහවුරු කළ යුතුය.
5. විගණකාධිපතිවරයා හෝ ඔහුගේ බලයලත් නිලධාරියකු සිදුකරන ලද විගණන පරීක්ෂාවක් මගින් වංචාවක් දූෂණයක් හෝ ඊට ආනුශංගික වෙනත් ඒ හා සමාන රජයේ මුදල් අවභාවිතාවක් හෝ රජයේ දේපල අවභාවිතාවක් සිදුවී ඇති බව තහවුරු වන හා අධිකරණය තුල ගොනුකල හැකි සාක්ෂි හෙලිදරව් වන අවස්ථාවලසි නීතිපතිවරයා මගින් අධිකරණය වෙත කරුණු වාර්තා කිරීමේ බලය විගණකාධිපතිවරයා වෙත බලතල පැවරෙන ලෙස ආණ්ඩුක5ම ව්‍යවස්ථාවේ 154(5) V අනු ව්‍යවස්ථාව ලෙස නව සංශෝධනයක් එක් කල යුතුය.
6. නීතිපතිවරයා මගින් අධිකරණය වෙත කරුණු වාර්තා කිරීම මත සිදුකරන අධිකරණය කටයුත්තකදී හැර අධිකරණය කටයුත්තක් සඳහා විගණකාධිකපති වාර්තා භාවිතයට ගන්නා අවස්ථාවලදී එකී විගනන වාර්තා බිඳහෙලිය හැකි පූර්ව නිගමනයක් සේ සලකා කටයුතු කල හැකි පරිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(5) VI අනු ව්‍යවස්ථාව ලෙස නව සංශෝධනයක් එක් කලයුතුය
7. අසීමාන්තිකව කැබිනට්, කැබිනට් නොවන සහ රාජ්‍ය අමාත්‍යවරු පත් කිරීම සීමාවකට ලක් කර, අමාත්‍ය මණ්ඩලය 20කට සීමා යුතු අතර, අමාත්‍යාංශ විෂයන් පිළිගත හැකි පදනමක් මත බෙදිය යුතුය. ඊට සමගාමීව නියෝජ්‍ය අමාත්‍යවරුන් පත් කල හැකි අතර එය 20 නොඉක්මවිය යතුය. අමාත්‍යංශ විෂය පථය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් විය යුතුයි . කාලීන අවශ්‍යතා මත එය වෙනස් කිරීමක් අවශ්‍ය වුව හොත් වෙනස් කරන ආකාරය ද ව්‍යවස්ථාවේ ම දැක්විය යුතුයි.
8. අමාත්‍ය මණ්ඩල තීරණ, රජය විසින් එළඹෙන අන්තර්ජාතික ගිවිසුම්, ජාතික සම්පත් හා සම්බන්ධිත ගිවිසුම් පිළිබඳ වාර්තාවක් ආසන්නතම පාර්ලිමේන්තු වාරයේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.
9. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52-2 අනුව්‍යවස්ථාව යටතේ අමාත්‍යවරු විසින් ලේකම්වරුන්ට ලබා දෙන විධාන සහ පාලනයට අදාළ මෙහෙයවීම් ලිඛිතව සිදු කළ යුතු ය.
10. අමාත්‍යවරයා වෙනස් වීම මත ලේකම්වරයා වෙනස් නොවන බවට ප්‍රතිපාදන ඇතුල් විය යුතුය
11. එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තියේ මූලධර්මයන්ට අනුකූලව දූෂණ වැළැක්වීම සඳහා නෛතික විධිවිධාන සහ ආයතික ව්‍යුහයන් ස්ථාපිත කළ යුතුය.
12. රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආර්ථිකමය වශයෙන්, කාර්යක්ෂම, සඵලදායීතාව සහ වගවීම තහවුරු වන ලෙස යාවත්කාලීන කිරීම ප්‍රසම්පාදන කොමිසමේ මුඛ්‍ය අරමුණ විය යුතු ය.
13. මාර්ගෝපදේශවලින් බැහැරව සිදු කරන ප්‍රසම්පාදන ක්‍රියාවලීන්ට සහභාගිත්වයක් දක්වන බලධාරීන්ට එරෙහිව නෛතික ක්‍රියාවලීන්ට එළඹීමේ බලතල ප්‍රසම්පාදන කොමිසමට පැවරිය යුතු ය.
14. මහා පරිමාණ මූල්‍ය වංචා වන්ට ඉඩ සැලසූ "ඉල්ලීමක් නැති යෝජනා" (unsolicited proposals) ක්‍රමය සඳහා 19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 156 ඇ (1)(ඉ) අනු ව්‍යවස්ථාව යටතේ ආවරණය

ලැබෙන හෙයින් ප්‍රසම්පාදන පටිපාටීන් උල්ලංඝනය කරන්නන් සම්බන්ධයෙන් නඩු පැවරිය හැකි වන පරිදි එම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතුය

15. මහජන නියෝජිතයන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ විධිමත් ක්‍රමවේදයකට සමාලෝචනය සහ සැක කටයුතු අවස්තාවලදී පරීක්ෂා කළ හැකි පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙ 154 (1) අනු ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු ය.

16. ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජයට හෝ රජයට අයිති ආයතනයකට හෝ රජය වෙනුවෙන් වෙනත් පාර්ශවයක් විසින් සෘජුවම හෝ වක්‍රව දරනු ලබන සමාගම් ද රජය වෙනුවෙන් එලබෙන ගිවිසුම් යටතේ ආරම්භාකරන ණය ආධාර ව්‍යපෘති ඒකාබද්ධ අරමුදලින් අරමුදල් සැපයෙන වෙනත් ඕනෑම ආයතනයක්ද මහජන අරමුදල් එක්රැස්කරනු ලබන සංවිධානද ඒවායේ ගිණුම්ද ඇතුලුව විගනනය කරනු ලැබීමට හැකිවන පරිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙ 154 (1) අනු ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු ය.

17. රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ සම්පූර්ණ පාලනය සහ වගවීම පාර්ලිමේන්තුවට පැවරීමට අදාළ නීති, විශේෂයෙන් ම මූල්‍ය පාලනය පිළිබඳ පාර්ලිමේන්තු කමිටු බලතල (උදා: කෝප්, කෝපා සහ රාජ්‍ය මූල්‍ය කාරක සභාව) වැඩිදියුණු කර ශක්තිමත් කළ යුතු ය.

18. විගනකාධිපතිවරයාගේ කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි බැංකු ඇතුලු ඕනෑම පාර්ශවයක් හෝ ආයතනයක් සතුව පවතින තොරතුරු ලබාගැනීමේ ද කරුණු පැහැදිලි කරවා ගැනීමේ ද බලතල පැවරෙන ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙ 154 (5) III අනු ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු ය.

19. රාජ්‍ය ආයතන පිළිබඳව සහ ජාතික වැදගත්කමකින් යුතු සම්පත් පිළිබඳව තීරණ ගැනීමේ දී අදාළ පාර්ශ්වයකරුවන් (Relevant Stakeholders) විමසා, පාරදෘශ්‍ය ක්‍රියාවලියක් තුළ එකී තීරණ ගත යුතු ය.

20. සියලු සිවිල්, දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික අයිතීන් තහවුරු කළ යුතු ය.

21. සියලු ජනකොටස්වලට (ජාතිකත්වය, ආගම, කුල-ගෝත්‍ර, ලිංගිකත්වය, භූගෝලීය සීමා, ජීවන වෘත්තීන් සහ සංස්කෘතිය ආදී විවිධතා නිසා පීඩාවට පත්ව සිටින ජනකොටස්වලට) සාධාරණ හා යුක්තිගරුක ලෙස ජීවත්විය හැකි පසුබිමක් සහතික කිරීමේ නෛතික ප්‍රතිපාදන ව්‍යවස්ථාවට ඇතුලත් විය යුතුය.

22. සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීමට හා ශක්තිමත් කිරීමට ඉඩ ලබා දිය යුතු ය. ඒ යටතේ ව්‍යවස්ථාදායකය සහ ජනතාව සම්බන්ධ කරන පුරවැසි සභාවක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය.

23. ව්‍යවස්ථාවේ පොදු දේපළ සම්බන්ධයෙන් ඇති නිර්වචනයට පහත සඳහන් අංශ ද ඇතුළත් විය යුතුයි - මහජන සංඛ්‍යාත, ස්පර්ශ අස්පර්ශ සංස්කෘතික උරුමයන්, ජෛව විවිධත්ව උරුමයන් සහ කාබන් පා සටහන් (Carbon Footprint)

24. පාර්ලිමේන්තුවේ අනුදැනුම ඇතිව පොදු දේපළ ගිවිසුම් සහ විදේශ ණය ලබා ගැනීම/ සුරක්ෂිත කිරීම සඳහා ගිවිසුම් අත්සන් කිරීමට විනිවිදභාවයක් ඇති යාන්ත්‍රණයක් සකස් කළ යුතු ය.
25. ශ්‍රී ලංකාව විදේශ වෙළඳ ගිවිසුම්වලට එළඹීම ජාතික වෙළඳ ප්‍රතිපත්තියකට අනුකූලව සිදු විය යුතු ය.
26. ජාතික සම්පත් සම්බන්ධයෙන් මහජනතාවට ඇති පරමාධිපත්‍යය තාවකාලිකව හෝ දීර්ඝකාලීනව බැහැර කිරීම පාර්ලිමේන්තුවේ අනුමැතියකින් තොරව සිදු නොකළ යුතුය.
27. ජාතික ලැයිස්තු මන්ත්‍රීවරු පත් කිරීමේ දී නියෝජනයක් නොලබන කණ්ඩායම් හා විශේෂත්ව දැනුම සහිත පුද්ගලයන් ඇතුළත් කිරීමට ප්‍රතිපාදන සැළසිය යුතු අතර මහජන ඡන්දයෙන් ප්‍රතික්ෂේප කළ පුද්ගලයන් පත් නොකිරීමට ව්‍යවස්ථාවෙන් විධිවිධාන සැලසිය යුතු ය.
28. නාමයෝජනා ලබාදීමේදී ජාතික ලැයිස්තුවට ඇතුළත් නොකළ පුද්ගලයෙතකු ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පත් නොකළ යුතුය.
29. මහජන නියෝජිතයින්ට බලය හෝ වරප්‍රසාද අරඹයා පක්ෂ මාරු කිරීමේ ඉඩකඩ අවම කළ යුතුයි. ඒ සඳහා විපක්ෂයෙන් ආණ්ඩු පක්ෂයට ඒක්වී තනතුරු හෝ වරප්‍රසාද ලබා ගැනීම වැලකෙන අකාරයේ නීති සම්පාදනය කළ යුතුවේ.

- **20 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත නව ප්‍රතිපාදන සම්බන්ධව සංසන්දනය**

20 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් අභියාචනාධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් වැඩි කිරීම සඳහා වූ ප්‍රතිපාදනය 22 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත මගින් යෝජනා කර නොමැත.

ප්‍රතිසංස්කරණ සඳහා වූ සාමූහිකයේ යෝජනාව තුල ඇතුලත් වන්නේද එම ප්‍රතිපාදන සංශෝධනය නොකර එලෙසම පැවතිය යුතු බවයි.

*ඇමුණුම් - I*

**ප්‍රතිපසංස්කරණ සඳහා සාමූහිකයේ යෝජනාවලිය යෝජනාවලිය සකස් කිරීමේ දී පහත සඳහන් සංවිධාන සහ කණ්ඩායම් වල යෝජනා සැලකිල්ලට ගනු ලැබිණි.**

1. ත්‍රෛනිකායික නිකායික අතිපූජ්‍ය මහානායක මාහිමිපාණන් වහන්සේලාගේ යෝජනා
2. ශ්‍රී ලංකා නීතිඥ සංගමය
3. මාර්තු 12 ව්‍යාපාරය
4. සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය
5. ගාලු මුවදොරින් ඔබ්බට පුරවැසි යෝජනාවලිය
6. විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමය
7. පැෆ්රල් සංවිධානය
8. ඩිරෙක්ෂන් ශ්‍රී ලංකා
9. දෙවන පරපුර
10. ඊ බිල්ඩ් ශ්‍රී ලංකා 2022
11. සහාගීත්ව යාන්ත්‍රණයක් හරහා ජනතා ව්‍යවස්ථාවක්
12. ජන අරගල සහයෝගීතා ව්‍යාපාරය
13. රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය
14. ඉදිරිය සඳහා තරුණ සාමුහිකය
15. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැශනල් ශ්‍රී ලංකා ආයතනය
16. සාමාජවාදී ශිෂ්‍ය සංගමය
17. අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය
18. 21 ව්‍යවස්ථා සංශෝධන යෝජනාව - සමගි ජන බලවේගය
19. 22 වන ව්‍යවස්ථා සංශෝධන යෝජනාව( විජේදාස රාජපක්ෂ මන්ත්‍රීවරයාගේ පුද්ගලික කෙටුම්පත
20. ජාතික ජන බලවේගය
21. පාරිභෝගික අයිතීන් සුරැකීමේ ව්‍යාපාරය
22. ජාතික සාමුහික ප්‍රකාශනය
23. ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය
24. මහජන සභාව
25. සෞඛ්‍ය වෘත්තීය වේදීන්ගේ විද්වත් සංගමය
26. ලංකා වාණිජ මණ්ඩලය
27. ශ්‍රී ලංකා විගණන සේවා සංගමය
28. නවක මන්ත්‍රීවරුන් කණ්ඩායම

***ඇමුණුම් - I I***

## ප්‍රතිසංස්කරණ සඳහා සාමුහිකයේ සාමාජිකයන්

1. ආචාර්ය පූජ්‍ය ඕමල්පේ සෝභිත හිමි - මහජන සභාව
2. මහාචාර්ය අගලකඩ සිරිසුමන හිමි- කොළඹ විශ්ව විද්‍යාලය
3. ගරු ආසිරි පී පෙරේරා බිෂොප්තුමා
4. ගරු රොහාන් සිල්වා පියතුමා- සමාජ හා සාමයික කේන්ද්‍රය
5. ගරු එම් අනුර එල් පෙරේරා පියතුමා මහජන සභාව
6. කරු ජයසූරිය- සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරය
7. රංජිත් ආරියරත්න- ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය
8. රෝහණ ද සිල්වා- ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය
9. මහාචාර්ය ශ්‍යාම බන්නැහැක- විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමය
10. රංජිත් දිසානායක- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය
11. ප්‍රසන්න ඇලපාත - සභාපති, ශ්‍රී ලංකා විගණන සේවා සංගමය
12. උදේණි දිසානායක- ප්‍රධාන ලේකම් ජාතික වෘත්තීය සමිති පෙරමුණ
13. සමන් රත්නප්‍රිය- රජයේ හෙද නිලධාරීන්ගේ සංගමය
14. චින්තක බණ්ඩාර- තැපැල් වෘත්තීය සමිති එකමුතුව
15. ලාල් බංගමුවගේ - ස්වාධීන වරාය සේවක සංගමය
16. සජීව ලියනගේ -ටෙලිකොම් සියලු සේවක සංගමය
17. චමින්ද පෙරේරා- ලංකා වෘත්තීය සමිති සම්මේලනය
18. තමරා දයානි හෙට්ටිමුල්ලගේ - ජාතික වෘත්තීය සමිති පෙරමුණ
19. රවී කුමුදේශ් - සෞඛ්‍ය වෘත්තීයවේදීන්ගේ විද්වත් සංගමය
20. අසේල සම්පත් - පාරිභෝගික ආහාර සුරක්ෂිතා සංගමය
21. නීතිඥ රජීව් අමරසූරිය- ඩිරෙක්ෂන් ශ්‍රී ලංකා
22. ජනාධිපති නීතිඥ ජෙෆ්රි අලගරත්නම්- ඩිරෙක්ෂන් ශ්‍රී ලංකා
23. මහාචාර්ය ප්‍රසාද් කටුලන්ද- ඩිරෙක්ෂන් ශ්‍රී ලංකා
24. තිලක් කාරියවසම් - සිවිල් සමාජ සාමූහිකය
25. වෛද්‍ය විනයා ආරියරත්න - සභාපති සර්වෝදය ව්‍යාපාරය
26. ආචාර්ය ජෙහාන් පෙරේරා- ජාතික සාම මණ්ඩලය
27. ඉෂාන් ජලීල් -සමාජ ක්‍රියාකාරික හා අන්තර්කරණ උපදේශක
28. වෛද්‍ය අශෝක ජයසිංහ- ජාතික ප්‍රතිපත්ති සඳහා වෘත්තිකයන්ගේ සංගමය

29. දූෂී බාලසිංහම් - ශ්‍රී ලංකා සංවර්ධන පහසුකම් සැලසීමේ සංවිධානය
30. නදීශානි පෙරේරා- ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය
31. සමන් හමන්ගොඩ- පැල්ට්‍රා ආයතනය
32. සමාදානි කිරිවන්දෙණිය- සණස ව්‍යාපාරය
33. රෝහණ හෙට්ටිආරච්චි- පැෆ්රල් සංවිධානය
34. උපේක්ෂි ප්‍රනාන්දු- මාර්තු 12 ව්‍යාපාරය
35. සුනිල් ජයසේකර- නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
36. විශාකා ධර්මදාස - යුද්දයෙන් විපතට පත් කාන්තාවෝ
37. නිශාන්ත ප්‍රිතිරාජ් දේශෝදය ජාතික සභාව
38. දයා හේරත් - ලක්බිමේ මවුවරුැ සහ දියණියෝ
39. ඔස්ටින් ප්‍රනාන්දු- හිටපු ජනාධිපති ලේකම්
40. මංගල පී.පී. යාපා- වරලත් ඉංජිනේරුැ
41. ජනාධිපති නීතිඥ ජාවෙඩ් යූසුෆ්
42. සෝමරත්න දිසානායක- ප්‍රවීනි චිත්‍රපට අධ්‍යක්ෂක
43. වෛද්‍ය රාජා විජේතුංග
44. බර්නාඩ් එදිරිසිංහ